සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

විශය සමගාමී ක්‍රියාකාරකම්

නිවාඩුකාලීන පැවරුම්

විෂය - ගණිතය

අගෝස්තු - 3 සතිය

සැකසුම - D.A. චම්පිකා දේවනාරායන

කෑ/දෙහි/ඉඹුලාන ශ්‍රී සේන මහා විද්‍යාලය

---

## ඉක්මණින් ගණන් කරමු

ආදරණීයදුවේ පුතේ , ඔබේ නිවසේ සිටින සහෝදර ශෝදරියන් සමග හෝ අවට යළුවන් සමග මෙම ක්‍රීඩාවේ යෙදෙන්න . සිටින පිරිස අනුව කණ්ඩායමකට සමානව බෙදෙන්න. දෙදෙනෙකුට වුවද වෙනම කණ්ඩයම් වී මෙම ක්‍රීඩාවේ යෙදිය හැක. කණ්ඩායම් දෙක ලොකු බෝල දෙකක් ගන්න. ආරම්භයේදී කණ්ඩයම් දෙක එකවරම බෝල දෙක උඩ දමන්න. බෝලය බිම නොවැටෙන පරිදි ගණන් කරමින් බෝලයට ගසන්න කුමන හෝ කණ්ඩායමක බෝලය බිම වැටුණහොත් ඒවන විට බෝලය නොවැටුණු කණ්ඩායමට ලකුණක් හිමි වේ . නැවත කණ්ඩායම් දෙක බෝලය එක වර උඩ දමන්න. ගණන් කරමින් වැඩි වේලාවක් බෝලය උඩරදවා ගන්න. කිසියම් වේලාවක් තුළ මෙම ක්‍රීඩාවේ යෙදෙන්න. වැඩිහිටි කෙනෙකුගේ සහය ලබා ගන්න. ඔබ ගණන් කරන විට,

* 1,2,3,4.......

* දෙකෙන් දෙක - 2,4,6,8,......

* පහෙන් පහ - 5,10,15,20......

* දහයෙන් දහය - 10,20,30,....

3 ශ්‍රේණියේදී ඉගෙන ගෙන ඇති පරිදි කැමති ක්‍රමයක් ඉහත ක්‍රම වලින් තෝරාගන්න. වැඩි වේලාවක් ගණන් කරමින් බෝලයට ගැසීමෙන් ඔබේ ගණන් කිරීමේ හැකියාව දියුණුවේ.

**ඔබට ජය....!**